# උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලය

**(1987 අංක 50 දරණ පනත යටතේ සංස්ථාගත කරන ලද)**

# පුරප්පාඩු

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලයේ පහත සඳහන් තනතුර පුරප්පාඩුව පිරවීම සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ගිණුම් නිලධාරී - II ශ්‍රේණිය - JM 1-1 (තනතුරු 01)

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ / ගණකාධිකරණය උපාධියක් ලබා තිබීම.
2. වාණිජ / ගණකාධිකරණ ක්ෂේත්‍රයට අදාල පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන" (MA 1-2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවු: 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** රු.72,650 - 10 X 1,360 - 18 X 2,040 - රු.122,970/=

**ආරම්භක මූලික වැටුප :** රු. 65,633/= (2026)

(ඉහත වැටුප් පරිමාණය ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 1/2025 අනුව ඉදිරිපත් කර ඇති අතර මෙම පරිමාණයේ සඳහන් ආරම්භක වැටුප් පියවර 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ. මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**පොදු කොන්දේසි**

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

ආ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් රහිතය.ස්ථාන මාරුවීම් නොමැත.

ඇ. සියලු අයදුම්කරුවන් කළමනාකරණ මණ්ඩලය මගින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඇ. සේ.අ.අ. සඳහා වැටුපෙන් 10% ක මුදලක් සේවා දායකයා විසින් ගෙවිය යුතු අතර, සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.නි.භා.අ. සඳහා 3% ක මුදලක් සේවායෝජකයා විසින් දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

ඉ. තෝරා ගන්නා අයදුම්කරුවන්ට වෛද්‍ය, හදිසි අනතුරු රක්ෂණ පහසුකම් යනාදි ප්‍රතිලාභ හිමිවේ.

ඊ. ඉහත සුදුසුකම් සහ තනතුරට අදාල පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා අයදුම්පත සමඟ එවිය යුතුය. (සහතිකපත් වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

උ. ඉහතඅවශ්‍යතාවයන්ටඅනුකූලනොවනඅයදුම්පත්,අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දින පසු වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, ලද අයදුම්පත් වලින් වැඩිම සුදුසුකම් ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

ඉහත තොරතුරු ඇතුළත් අයදුම්කරු පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් ඇතුළත් කරන ලද සම්පූර්ණ ජීව දත්ත සටහනක් ද සහිත අයදුම්පත් 2026.09.10 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

**ප්‍රධාන විධායක නිලධාරී / මාර්ෂල්**
**උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය**
**තැ.පෙ. 223, කොළඹ 12.**
**04/09/2026**